# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO — 522/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 25/03/2024 පැය 1425

## මාධ්‍ය නිවේදනය

<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>

**01.** **2024.03.23 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 33 | 782 | තඹ දඟර 02<br>යකඩ බැරල් 07 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර.**

2024.03.24 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කිරිඇල්ල පොලිස් වසමේ කොටුගොඩැල්ල වත්ත ප්‍රදේශයේදි වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පතල් කැණීම් කරමින් සිටි සැකකරුවකු අත්ඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 වන කිරිඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**03. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් ටිපර් රථ වලින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් හය දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුර.**

2024.03.24 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මරදන්කේණි පොලිස් වසමේ අම්පන් ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් ටිපර් රථ වලින් වැලි ප්‍රවාහනය කල සැකකරුවන් හය දෙනෙකු ටිපර් රථ හයක්ද සමග අත්අඩංගුවට ගෙන මරදන්කේණි පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20ත් 47ත් අතර වයස් වල පසුවන වන ජේදුරුතුඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරදන්කේණි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**